සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසන් පෙරහුරු පරීක්ෂණය (2022-2023)

## (47) සිංහල සාහිත්‍ය රසාස්වාදය

11 ශ්‍රේණිය කාලය පැය 03යි.

විභාග අංකය / නම :-..............................................................................................................

## 1 පත්‍රය

1 පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම උත්තර සපයන්න.

1. (1) සිට (V) තෙක් ඇති කොටස් කියවා බලා ඒවා ඇසුරෙන් අසා ඇති (අ) ,(ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(1) " එසේය සොඳුර පළමු මම උදකලායෙමි. දැන් අපි දෙදෙන මෝ වූම්හ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?..............................................................................................

(ආ)මෙහි දැක්වෙන පරිදි අපි දෙදෙනා යනු කවරෙක් ද?

..............................................................................................................................................

(ii) "එසේ වී නම් දෙවහනන් ලබන නියාවට මෙ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?.............................................................................................

(ආ) ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?........................................................................................

(iii) "උඹ ඔය බීගෙන රණ්ඩුවට යන්ඩ ඔන් නෑ. මෙයා ඉස්කෝලෙන් අස්කර ගත්තහම එච්චරයිනේ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?..............................................................................................

(ආ) මෙහි උඹ යනුවෙන් දක්වා ඇත්තේ කවුද?.................................................................................

(iv)

මිනිස්හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු **මෙදියත** උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරද බර **සහස් පත**
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළිනි යුත

(අ) ඉරි ඇඳි පදවල තේරුම ලියන්න.

..............................................................................................................................................

(ආ) මෙය උපුටා ගත් පද්‍ය පන්තිය හා රචකයා නම් කරන්න.

..............................................................................................................................................

(v)

අම්බලන්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

(අ)

අම්බලන්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන් .... යනුවෙන් කවියා මතු කරන අදහස කුමක් ද?

..............................................................................................................................................

..............................................................................................................................................

(ආ) කවි පෙළෙහි රචකයා ගේ නම කුමක් ද?.....................................................................................

(2) පහත සඳහන් කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

"දේවයන් වහන්ස, නුඹ වහන්සේ සැකයෙන් නොසිතුව මැනව. කීප දවසකින් උන් නුඹ වහන්සේ වශයට පමුණුවා මාගේ සාමාර්ථ්‍යය දක්වා ලමි" යි බෝධිසත්වයන්ට කියා තමා ගිය කාර්යය සමෘද්ධ කොට ගෙන ප්‍රභාවතීන් කරා ගොස් උන්ගේ ගෙය කසළ අදින්නියක මෙන් යටත් පිරිසෙයින් ගසා ලන්ට නිසි කැටත් විවරකුත් ගෙයි නොතිබා වහන් පටන් සියල්ල ම දොර ගාවා ලා ගෙය හැමද කසළ දමා දොරට පිටලා එළිපත් පඩිය උස් පුටුවක් ලා ඊට මිටි ව ප්‍රභාවතීන්ට අස්නත් පනවා " දියණියනි , මෙසේ අව මැනව , ඉස බලම්හ" යි ප්‍රභාවතී මිටි පුටුවෙක ඉඳුවා ගෙන තොමෝ උස් පුටුවෙක තමාගේ දණ දෙකින් උන්ගේ ඉස වහල කොට ගෙන මැදත් ඉසනිය ගා අනේ මුන්ගේ ඉස උකුණෝ බොහෝව ගියේ යයි කියමින් තමාගේ ඉසින් උකුණන් හැරගෙන ප්‍රභාවතීන්ගේ අත්ලෙහි ලා "තොපගේ ඉස උකුණන්ගේ විවර බලව" යි යනාදීන් නොයෙක් කථා කොට බෝධිසත්වයන්ගේ ගුණ කියමින් "මේ ප්‍රභාවතී තොමෝ කුසරජ්ජුරුවන්ගේ නුවර වසන සමයෙහි ඒ කුසරජ්ජුරුවන් වහන්සේගේන් අන්නපාන වස්ත්‍රාභරණ ගන්ධමාලා තාම්බුලාදී කිසි සත්කාරයකුත් මුන් නොලදැයි සිතමි. කාරණා කිම යත් ස්ත්‍රීහු නම් එක දවසකුත් ඇකයෙහි වැතිර ඔත් ස්වාමිපුත්‍රයාගේ සිත් නොකලකිරුවති. මේ කුස රජ්ජුරුවන් වනාහි අරක්කැමිව තොප නිසා රාජශ්‍රීය හැර අවුත් බැලමෙහෙ කොට දුක් විඳිමින් සිටියදීත් සුවදුක් විචාරීමකුත් නොකරව ඉඳින් උන්වහන්සේ කෙරෙහි ස්නේහය නැතත් මුළු දඹදිවට අග්‍රරාජන් වූ මේ කුස රජ්ජුරුවන් වහන්සේ මා නිසාම දුක් ගන්නා සේකැයි දැන උන්වහන්සේට කිසි සත්කාරයක් කරන්නට උවමැනවයි" කිව. එබස් අසා ප්‍රභාවතී කිපී සඳ කුදත් නැගී සිට ප්‍රභාවතීන් කරටිය අල්වා ඇතුළු ගෙට දමා තොමෝ පිටත්ව දොර අදිනා ලනුව ඇද අල්වාගෙන සිටියා ය. එසඳ ප්‍රභාවතී උන් අල්වා ගත නොහී දොරමුල වැද සිට ඇට දොඩමින් මෙබඳු වූ නොකිවමනා බස් කියන්නාක් වූ නොකටයුතු දන්නා මෙකලී සියුම් මුවහත් ඇති ශාස්ත්‍රයෙන් ජීවිතාච්ඡේදනය ලබන්නට නිසි එකක යි යනාදී කිපුණාය. "ඉක්බිති කුදත් ළංව ලනුව අල්වා ගෙන සිට පින්මද නොකීකරු තෙනැත්තිය , තිගේ රුව කාට කුමක් කෙරේ ද අපි තොපගේ රූපයෙන් කා බී රැකෙන දෙයක් ඇද්ද" යනාදීන් දොඩා බෝධිසත්වයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් "තෙල ප්‍රභාවතිය , ආරෝහ පරිණාහයෙන් යුක්ත වූ සිද්ධාංගනා ප්‍රතිභාග වූ විශිෂ්ට වූ රූ ඇත්තෙමියි තිගේ රූප සෞන්දර්ය හා ඒ රාජාධිරාජ වූ කුස රාජෝත්තමයන් හා සමාන කොට නොසිතව".

(i) පබාවතී කුසරජ්ජුරුවන් කෙරෙහි පහදවා ගැනීම සඳහා කුදී යෙදූ උපක්‍රම දෙකක් ඡේදය ඇසුරින් ලියා දක්වන්න.

(ii) කුස රජ්ජුගේ නුවර වෙසෙන කාලයේ දී නොලද සත්කාර මොනවා ද?

(iii) ප්‍රභාවතීට කේන්ති ගියේ කුදීගේ කුමන ප්‍රකාශයකින් අනතුරුව ද?

(iv) මෙම සිද්ධියෙන් අනතුරුව කුදී කරනු ලද ක්‍රියාව කුමක් ද?

(ලකුණු 06

නැතහොත් ,

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදු රැස් දහරයි
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතු වී
යසස උදාවෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන් ලැබුව නිදානයි

(i) මෙම ගීතය දේශාභාමානී හැඟීම් ඇති කරවන්නා වූ ගීතයකි. මේ අදහස තහවුරු කෙරෙන යෙදුම් මොනවා ද?

(ii) දේශය, බුදු දහමින් පෝෂණය ලැබූ ආකාරය ඉස්මතු වන කරුණු මොනවා ද?

(iii) මෙම පොළොව පුතුට උරුම වන නිදානයන් බව කීමට කවියා ස්වාභාවික පිහිටීම හා ස්වාභාවික සම්පත් යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

(iv) තම අත්දැකීම් ඉදිරිපත් කිරීම සඳහා රචකයා ඉවහල් කර ගෙන ඇති කාව්‍ය ආකෘතිය කොතරම් ගැළපේදැයි විමසන්න.

(ලකුණු 06යි)

## 11 පත්‍රය

සැලකිය යුතුයි

පළමුවැනි ප්‍රශ්නය ද 2,3,4,5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

1.පහත දී ඇති පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාභකම බිම වැඩකර දියෙන් වැ වේ
රන්වන් කරල් බර වී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම් දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එනතුරුම සිට පෙන් වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණ ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැමතැන ලකුණුව ඇත්තේ

කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පනහ වත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැතී
හිතවත්කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී මගේ කම්මුල රතු පැහැය ගතී

(අ) මෙම කවි පෙළට පාදක වූ අත් දැකීම
(ලකුණු 04යි)

(ආ) පද්‍ය පන්තිය සඳහා උපයුක්ත භාෂා භාවිතය
(ලකුණු 04යි)

(ඉ) පැදි පෙළ සාර්ථක කර ගැනීම සඳහා කවියා භාවිතා කළ කාව්‍යෝපක්‍රම
(ලකුණු 06යි)

(ඊ) පද්‍ය නිර්මාණයේ භාවිත ආකෘතිය
(ලකුණු 06යි)

(උ) ගැමි සමාජයේ වෙසෙන ගැමියන් කෙරෙහි කවියා තුළ පැවති දයානුකම්පාව හා සංවේදී බව
(ලකුණු 06යි)

(2) මිනිස් සිතේ හට ගන්නා විවිධාකාර ගුඪ සිතිවිලි හාස්‍ය රසය ද මුසු කොට රසබර කතන්දරයක් ලෙස ඉදිරිපත් කිරීමට ධර්මසේන හිමියන් දක්වන කුසලතාවය නන්ද වස්තුවෙන් උදාහරණ තුනක්වත් සපයමින් පහදන්න.
(ලකුණු 15යි)

(3) තුංමංහන්දිය නව කතාවේ සාර්ථකත්වයට කතුවරයා යොදා ගෙන ඇති භාෂා භාවිතය ඉවහල් වී ඇති ආකාරය නිදසුන් තුනක්වත් සපයමින් විමසන්න. (ලකුණු 15යි)

(4) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ "මග" පැදි පෙළ තුළින් හෙළි කෙරෙන ජීවන දෘෂ්ටීන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15යි)

(5) "වෙසක් පහන" දරුවන්ගේ ලෝකයේ දක්නට ලැබෙන එකිනෙකා හා බැඳුණු ආදරය, කරුණාව,විවරණය කරමින් ඉදිරිපත් කළ අපූරු කෙටිකතාවකි. නිදසුන් තුනක්වත් ඇසුරින් පහදන්න. (ලකුණු 15යි)